SC

RECEIVED
17 FEB 2010

# ලැකානියානු චින්තනය හා නව දෘෂ්ටිවාද පිළිබඳ විමර්ශනයක්.

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපීඨයේ දර්ශනය පිළිබඳ සමාජීය විද්‍යාපති උපාධිය සඳහා ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධය.

2007

නම : මනෝජ් සුචරිකා හරිස්චන්ද්‍ර

ශිෂ්‍ය අංකය: FGS/P/MSSc/2006/02.

| ප්‍රවේශ අංකය | 594 |
| --- | --- |
| වර්ග අංකය | |

**පර්යේෂණයේ අරමුණ:-**

මනෝවිද්‍යාව, දර්ශනය, වාග්විද්‍යාව, සාහිත්‍ය. ව්‍යුහවාදය හා පශ්චාත් නූතනවාදය යන සියලු ක්ෂේත්‍රයන්හි පර්යේෂණශීලී චින්තකයෙකු වූ ජේකස් ලැකාන් නම් යථාර්තවාදී මිනිසා පිළිබඳවත්, ඉහත ක්ෂේත්‍රයන් කෙරෙහි ඔහු දැක්වූ දායකත්වය පිළිබඳවත් අධ්‍යයනය කිරීම මෙම නිබන්ධිකාවේ මූලික අරමුණ ලෙස සඳහන් කළ හැකිය.

**අධ්‍යයන ක්ෂේත්‍රය:-**

"ලැකානියානු චින්තනය හා නව දෘෂ්ටිවාද පිළිබඳ විමර්ශනයක්" ලෙස නම් කරනු ලැබූ මෙම නිබන්ධිකාව මූලික අධ්‍යයන ක්ෂේත්‍රයන් කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරමින් සම්පාදනය කර තිබේ. මෙහිදී පළමුවෙන්ම ලැකානියානු මනෝවිශ්ලේෂණවාදී කාර්යභාරය විමර්ශනය කරන අතර, පුද්ගල අවිඥානයෙහි කාර්යභාරය හා එය පුද්ගලයා කෙරෙහි බලපාන ආකාරයත් ෆ්‍රොයිඩියානු අදහස්හි ඉදිරි සංවර්ධනය තුළින් මනෝවිශ්ලේෂණ ක්ෂේත්‍රයට නව සංකල්ප හඳුන්වා දීමත් කැඩපත් අවධිය නම් ලැකානියානු මූලික සංකල්පය භාවිතා කරමින් සිදුවන ළමා මනසේ සංවර්ධනය පිළිබඳ ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කිරීමත් මූලික අපේක්ෂාවයි.

වාග්විද්‍යාව කෙරෙහි ලැකාන්ගේ දායකත්වය විමසීමද මෙහි මූලික අපේක්ෂිතාර්ථයකි. එහිදී අද්විතීය වාග්විද්‍යාඥයෙකු ලෙස සැළකෙන ෆර්ඩිනැන්ඩ් ද සොසියුර් හා සම්බන්ධ වෙමින් සංඥාර්ථ විද්‍යාව භාවිතා කරමින් ව්‍යුහවාදී මනෝවිශ්ලේෂණවාදය දක්වා ගමන් කළ ලැකානියානු වාග්විද්‍යාත්මක පර්යේෂණ කෙරෙහිද අවධානය යොමු කිරීම අපේක්ෂිතය. එහිදී මූලික අවධානය යොමු කරන ක්ෂේත්‍රය ලෙස, මිනිස් විෂය හැඩගැසීමෙහිලා භාෂාවේ තීරණාත්මක දායකත්වය හඳුන්වා දිය හැකිය.

මෙම නිබන්ධිකාවේ සිව්වන පරිච්ඡේදය මගින් දාර්ශනික විෂය ක්ෂේත්‍රය තුළ ලැකානියානු දෘෂ්ටිවාදයන්හි ව්‍යාප්තිය විමසීමට අදහස් කරමි. මෙහිදී නූතනවාදී දාර්ශනික චින්තනයෙහි මූලික ආස්ථානයක් වූ "මම සිතමි, එනිසා මම පවතිමි" යන ඩේකාට්ගේ කොජිටෝ නම් සංකල්පය, "මම නොසිතන තැන මම සිටිමි" යන පශ්චාත් නූතනවාදී

ආස්ථානය මගින් විස්ථාපනය කිරීමට අරමුණු කරන අතර, ලැකාන් විසින් දාර්ශනික හා මනෝවිද්‍යාත්මක චින්තනය අතර පවතින සීමා අවම කළ ආකාරය පැහැදිළි කිරීමටද වැඩි ඉඩක් යොමුකර තිබේ.

වර්තමානයේ පශ්චාත් නූතනවාදය සීග්‍ර ලෙස සමාජය තුළ ව්‍යාප්ත වෙමින් පවතින විචාරවාදයකි. "අවිඥානය භාෂාව ලෙස ව්‍යුහගතවී ඇත" යන ප්‍රකාශය තුළ ගමන් කරමින් ලැකාන් මානව විඥානයේ චලිතමය ස්වභාවය පිළිබඳවත් මිනිස් ආශාවන්හි ස්වභාවය පිළිබඳවත් ඉදිරිපත් කළ අදහස් තුළින් පශ්චාත් නූතනවාදී චින්තන ප්‍රවාහය තුළ ලැකානියානු අනන්‍යතාවය විමසීමද අවධානය යොමු වූ ක්ෂේත්‍රයක් ලෙස දැක්විය හැකිය.

ලැකාන් යනු, බොහෝ පුද්ගලයන් විසින් "අමුතු මිනිසෙක්" යන විරුදාවලිය යටතේ හැඳින්වූ පුද්ගලයෙකි. එම හැඳින්වීමට හේතුව ඔහුගේ චින්තනය තුළ තිබූ නිදහස්භාවය හා අව්‍යාජභාවයයි. ඒ තුළ හිඳිමින් ඔහු සමාජ සංස්ථාවන් විවේචනය කළේය. ප්‍රශ්නාර්ථයට ලක් කළේය. මිනිස් අවිඥානයෙහි සැබෑ ස්වභාවය අනාවරණය කරමින් පුද්ගලයා සමාජ භූමිකාවන්හිදී පැළඳ සිටින වෙස්මුහුණට යටින් තිබෙන සැබෑ රූපය විස්තර කළේය. අවසාන පරිච්ඡේදය එනම්, "ලැකානියානු චින්තනය හා නව දෘෂ්ටිවාද" තුළදී විශේෂයෙන්ම විමර්ශනය කිරීමට අපේක්ෂා කරන්නේ, සමාජ සංස්ථාවන් හා පුද්ගල ක්‍රියාකාරිත්වය තුළ පවතින අව්‍යාජ, සත්‍ය ස්වරූපයයි.

## අධ්‍යයන ක්‍රමවේදයඃ-

අධ්‍යයන ක්‍රමවේදය ලෙස ද්විතීයික දත්ත පමණක් යොදාගත් අතර එහිදී ශාස්ත්‍රීය ග්‍රන්ථ පරිශීලනය, වෙබ් අඩවි හා අදාළව ලියැවී ඇති සඟරා, ලිපි ලේඛන මගින් දත්ත රැස් කර තිබේ.